10
පාඩම

# සේඛියා - II

## සේඛියා දහමින් හුරු පුරුදු වෙමු සුසිරිත් - 2

**බමහකත වගගය**
**(ගමෙහි හැසිරීම හා පිණ්ඩපාතය පිළිගැනීම)**

''**බමහකත**'' යනු ඉණෙහි දෑත් තබාගෙන ටැඹක් සේ කෙලින් හිඳීම හෝ සිටීමයි. ඕගුණ්ඨිතෝ හිසෙහි සිට පෙරවාගෙන හිඳීම හෝ සිටීමයි. මෙය ගිලන් අවස්ථාවක නම් වරදක් නොවේ. ''**උකකුටිකාය**'' යනු උක්කුටිකයෙන් හෙවත් ඇණ තියාගෙන හිඳීමයි. මෙය ද ඇවත් දෙසීම් ආදී සංඝ කර්ම අවස්ථා ආදියේ දී හා වන්දනාමානාදියේ දී වරදක් නොවේ. මෙහි වරදක් සේ දක්වා ඇත්තේ නිකරුණේ තැන් තැන්වල එසේ හිඳීමයි.

''**පලලතථිකාය**'' යනු බුරු ඇඳ වැනි ආසනයකට කියන නමකි. ඒ ආකාරයෙන් දණිස් උඩට එසවෙන පරිදි හා දෙපා එකට ගැටෙන පරිදි හිඳින අශෝභන ඉරියව්ව මෙහි පල්ලත්ථිකා නමින් ගැනේ. සාමාන්‍යයෙන් භික්ෂූන් වහන්සේ නමක් බද්ධ පර්යංකයෙන් හිඳින විට දෙපා එකට බැඳ හෝ එකක් මත එකක් තිබෙන සේ තබා දණහිස් බිම ගැටෙන තරමට පහත් වී සිටීමට පුරුදු වී සිටිය යුතු යි. එය නුපුරුදු ගිහි-පැවිදි බොහෝ දෙනා ඉඳගන්නේ යට කී පරිදි පල්ලත්ථිකාවෙනි. පල්ලත්ථිකා වර්ග දෙකකි.

**01. හතථපලලතථිකා හෙවත් දෑතින් දණහිස් බැඳගෙන හිඳ ගැනීමයි.**
**02. දුසසපලලතථිකා හෙවත් සිවුරෙන් හෝ ඇඳිවතින් දණහිස් පටලවා මුහුණතෙක් ඔසවාගෙන හිඳ ගැනීමයි.**

මෙය විශේෂයෙන් භික්ෂූන් වහන්සේලාට ඉතා අශෝභන නොහික්මුණු ආසනයකි.

**පිණ්ඩපාතය පිළිගැනීම පිළිබඳ ශික්ෂා පද**

පිණ්ඩපාතය පිළිගැනීම පිළිබඳ ශික්ෂා පද හතරක් ද මෙම වර්ගයට ඇතුළත් වේ. '**සකකචචං**' යනු සිහි නුවණින් පිළිවෙළකට ප්‍රමාණයකට පිළිගන්නේ යන අදහසයි. සාමාන්‍යයෙන් සැදැහැතියෝ පෙරත්ත කරමින් දන් බෙදති. එහෙත් ඒ බෙදන තරමට ඉවත දැමීමට තරම් නොපිළිගත යුතු ය. තමා වළඳන පමණ දැන පිළිගත යුතුයි. එසේ ම සකස්ව සංවරව හිඳගත යුතු බව ද මෙහි කිය වේ.

'**පතතසඤ්ඤී**' යනු පාත්‍රය වෙත ම අවධානය යොමු කරගෙන දන් පිළිගත යුතු බවයි. දන් පිළිගන්නා විට බෙදන්නා දෙස හෝ වටපිට නොබලා පාත්‍රය වෙත ඇස මෙන් ම හිත ද යොමු කරගෙගන පිළිගත යුතු ය. ඒ අවස්ථාවේ කිසිවෙකු සමග කතාබහ නොකළ යුතු ය. '**සමසූපකං**' යනාදියෙන් කියවෙන්නේ බතට සෑහෙන පමණට ව්‍යඤ්ජන පිළිගත

යුතු බවයි. මෙයින් නිකරුණේ අහර පිළිගෙන ඉවත දැමීමත් යම් යම් ආහාර කෑදරකමට පිළිගැනීමටත් පනවන ලද සික පදයකි. එසේ කිරීම සැදැහැතියන්ගේ කළකිරීමට ද හේතු වන්නේ ය. '**සමතිත්තිකං**' මෙය තමාගේ වැළඳීම සඳහා පිළිගන්නා ආහාර නොව පොදුවේ පිණ්ඩපාත චාරිකාවේ දී පිළිපැදිය යුතු ශික්ෂා පදයකි. පිණ්ඩපාතය යෑමේ දී සමහර විට පාත්‍රය පිරෙන්නට ආහාර ලැබේ. එහෙත් කිසි විටෙකත් පාත්‍රයේ ගැට්ටෙන් පිටතට කොතක් මෙන් මතුවන තරමට ආහාර නොපිළිගත යුතු ය. නිතරම පාත්‍ර ගැටියෙන් පහළට සිටින තරමින් සෑහීමකට පත් විය යුතු ය.

**ඛම්භකත වග්ගය - පෙළ සහ තේරුම**

**01. න ඛම්භකතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.**
ඉනෙහි අත් ගසාගෙන ඇතුළු ගමෙහි නො යන්නෙමි'යි හික්මිය යුතු ය.

**02. න ඛම්භකතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.**
ඉනෙහි අත් ගසාගෙන ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

**03. න ඔගුණ්ඨිතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.**
හිසේ සිට පොරවාගෙන ඇතුළු ගමෙහි නො යන්නෙමි'යි හික්මිය යුතු ය.

**04. න ඔගුණ්ඨිතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.**
හිසේ සිට පොරවාගෙන ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

**05. න උක්කුටිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.**
පා ඇඟිලිවලින් ඇතුළු ගමෙහි නො යමි'යි හික්මිය යුතු ය.

**06. න පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.**
පා ඇඟිලිවලින් ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

**07. සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.**
හොඳ සිහි කල්පනාවෙන් අහර පිළිගනිමි'යි හික්මිය යුතු ය.

**08. පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.**
පාත්‍රය වෙත යොමු කළ සිතින් අහර පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය.

**09. සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.**
බතට සෑහෙන තරමට පමණක් ව්‍යඤ්ජන සහිතව අහර පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය.

**10. සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.**
පාත්‍රා ගැටියෙන් පහතට සිටින පමණට අහර පිළිගන්නෙමි'යි හික්මිය යුතු ය

**අභ්‍යාස**

01. ''පිරිසිදුකමෙහි ඇති වැදගත්කම'' යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.
02. ගමෙහි හැසිරීමේ දී බැහැර කළයුතු අශෝභන චර්යා පහක් නම් කරන්න.
03. සේඛියා අර්ථ සහිතව වනපොත් කරන්න.

**පුහුණුවට**

| | |
|---|---|
| මුසාවත් | නොපවසන |
| කිසිවකුට | නොබණින |
| අර්ථය ධර්මය | දැන |
| මිහිරිව දම් | දෙසන |

(භික්ඛු වග්ගය - 03 ගාථා)

''පුද්ගලයෙකු ශ්‍රේෂ්ඨත්වය තැකෙන්නේ ඔහුගේ ක්‍රියා අනුව ය.
වැඩ නොකර නිකම් සිටීමෙන් මනුෂ්‍යයෙක් ශ්‍රේෂ්ඨත්වයට නො නගී.
වැඩ ද ලෝකයාට හිත සාදක නොවුවොත් මනුෂ්‍යයෙකුගේ තත්ත්වය
උසස් කිරීමෙහි හේතු නොවේ''

- වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමි -